

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඊ (1) ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ හයවැනි වාර්තාව

இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசின் அரசியலமைப்பின் 41 ஏ (1) எனும் உறுப்புரையின் கீழ் சமர்ப்பிக்கப்பட்ட அரசியலமைப்புப் பேரவையின் ஆறாவது அறிக்கை

The Sixth Report of the Constitutional Council submitted under Article 41G (1) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඌ (1) ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ හයවැනි වාර්තාව

අන්තර්ගතය

1. හැඳින්වීම 1

2. සභාවේ රැස්වීම් 1

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **41**ආ ව්‍යවස්ථාව යටතේ සභාවේ කාර්යය සහ කර්තව්‍යය 1

3.1. රාජ්‍ය සේවා කොමිෂන් සභාව 1

3.2. ජාතික පොලිස් කොමිෂන් සභාව 1

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **41**ඇ ව්‍යවස්ථාව යටතේ සභාවේ කාර්යන් සහ කාර්තව්‍යයන් 2

4.1. අග්‍රවිනිශ්චයකාර ධුරයට පත් කිරීම 2

4.2. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම 2

4.3. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර ධුරයට පත් කිරීම 3

4.4. පොලිස්පති ධුරයට පත් කිරීම 3

4.5. විගණකාධිපති ධුරයට පත් කිරීම 4

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැර වෙනත් ලිඛිත නීති මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පනවා ඇති හෝ පවරා ඇති කාර්යන් සහ කර්තව්‍යයන් ඉටු කිරීම 4

5.1 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම 4

5.2 ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ **(PUCSL)** සාමාජික ධුරයට පත් කිරීම 4

5.3 කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව සඳහා සාමාජිකයින් පත් කිරීම 5

5.4 හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජික ධුරයට පත් කිරීම 5

5.5. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ **(OMP)** සාමාජික ධුරයට පත් කිරීම 6

5.6. සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයට **(WBB)** සාමාජිකයින් පත් කිරීම 6

5.7. ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයේ සාමාජික ධුරයට පත් කිරීම 7

6. සභාවේ කාර්යයන් සහ කර්තව්‍යයන් කිරීම සහ ඉටු කිරීම සම්බන්ධ නීති සම්පාදනය කිරීම 7

7. **2016** අංක **12** දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම 7

8. සභාවේ සාමාජිකයින් වගඋත්තරකරුවන් ලෙස දක්වමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් අයදුම්පත් 8

1. හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ (මින්මතු 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව' ලෙසද හඳුන්වනු ලබන), ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට (මින්මතු 'සභාව' ලෙසද හඳුන්වනු ලබන) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ අනෙකුත් නීති මගින් පවරා ඇති කාර්යන් සහ කර්තව්‍යයන් කිරීමට සහ ඉටු කිරීමට නියම කර ඇත. 2025 ජූලි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ සභාව විසින් කරන ලද සහ ඉටු කරන ලද කටයුතු මෙම වාර්තාව මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඵ (1) ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරනු ලැබේ.

2. සභාවේ රැස්වීම්

සමාලෝචනයට භාජනය වන කාල පරිච්ඡේදය තුළ සභාව පහත සඳහන් දිනයන්හි දහහතර (14) වතාවක් රැස්විය:-

2025.07.09, 2025.07.23, 2025.08.07, 2025.08.12, 2025.08.19, 2025.09.09, 2025.09.24, 2025.10.08, 2025.10.24, 2025.11.21, 2025.11.28, 2025.12.03, 2025.12.05, 2025.12.17

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාව යටතේ සභාවේ කාර්යය සහ කර්තව්‍යය

3.1. රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (5) ව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ඉවත් කිරීමෙන් පසු, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ දැනට පවතින පුරප්පාඩුව සඳහා සභාව විසින් අයදුම්පත්‍ර කැඳවන ලදී. ඒ අනුව, අයදුම්කරුවන්ගේ ලැයිස්තුව සලකා බැලූ අතර, එය සලකා බලන අතරතුර මහාචාර්ය එන්. සෙල්වක්කුමරන් මහතාගේ ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ තවත් පුරප්පාඩුවක් පිළිබඳව සභාවට දන්වන ලදී. එබැවින්, සභාව විසින්, සාකච්ඡා කිරීමෙන් අනතුරුව, සලකා බලමින් පවතින අයදුම්කරුවන්ගේ ලැයිස්තුවට අනුකූලව පුරප්පාඩු දෙකම පිරවීමට තීරණය කරන ලදී. අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීමෙන් අනතුරුව, සභාව විසින් කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවන ලදී.

ඒ අනුව, අයදුම්කරුවන්ගේ සුදුසුකම් සහ යෝග්‍යතාවය සමඟ ස්ත්‍රී පුරුෂ භාවය ඇතුළුව බහුත්ත්ව ස්වභාවය සහ කොමිෂන් සභාවේ සංයුතිය තුළ විවිධ රාජ්‍ය සේවාවන්ගෙන් විශ්‍රාම ගිය නිලධාරීන්ගේ නියෝජනය සහතික කිරීමේ අවශ්‍යතාවය සලකා බලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (3) ව්‍යවස්ථාව යටතේ සභාව විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ පුරප්පාඩු සඳහා ලෙඩ්චුමානන් ඉලංගෝවන් මහතා සහ සොනාලි නෙළුම් ඉලංගකෝන් විජේරත්න මහත්මිය සභාව විසින් නිර්දේශ කරන ලදී.

3.2. ජාතික පොලිස් කොමිෂන් සභාව

ඩී. කේ. රේණුකා ඒකනායක මහත්මියගේ ඉල්ලා අස්වීම හේතුවෙන් ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ පුරප්පාඩුවක් ඇතිවී තිබෙන බව සභාවට දන්වන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාව යටතේ විසිඑක්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අනතුරුව ජාතික පොලිස් කොමිෂන් සභාව ස්ථාපිත කිරීමේදී සභාව විසින්, සාමාජිකයින් හත් දෙනෙකු පත් කිරීම සඳහා කරන ලද නිර්දේශය ද සභාව විසින් සඳහන් කරන ලදී. කෙසේ වෙතත්, එවක සිටි ජනාධිපතිවරයා සභාව

විසින් එකී කොමිෂන් සභාවේ සාමාජික ධුරයට නිර්දේශ කරන ලද නාමිකයන් හත් දෙනාගෙන් හය දෙනෙකු පමණක් පත් කර තිබෙන බව සභාව විසින් සැලකිල්ලට ගන්නා ලදී. එබැවින්, සභාව විසින් නිර්දේශ කරන ලද හත්වන නාමිකයා එම කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් නොකිරීම හේතුවෙන් සංයුතියේ ඇතිවී තිබෙන පුරප්පාඩුව සඳහා ද සුදුසු තැනැත්තකු නිර්දේශ කරනු ලැබිය හැකි බව සභාවේ මතය වූ අතර ඒ අනුව, ධුරයේ දැනට පවතින පුරප්පාඩු දෙකම පිරවීම සඳහා තෝරාගැනීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමට තීරණය කරන ලදී. අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීමෙන් අනතුරුව, සභාව, කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවන ලදී.

අයදුම්කරුවන්ගේ සුදුසුකම් සහ යෝග්‍යතාවය සමඟ ස්ත්‍රී පුරුෂ භාවය ඇතුළුව බහුත්ත්ව ස්වභාවය සහතික කිරීමේ අවශ්‍යතා සලකා බැලීමෙන් අනතුරුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (3) ව්‍යවස්ථාව යටතේ, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික ධුරය සඳහා දොන් දර්ශන උදය කුමාර හෙට්ටිආරච්චි මහතා සහ බුවනෙකබාහු පටබැඳිගේ පේමාවතී සිරිවර්ධන අබේගුණරත්න මහත්මිය සභාව විසින් නිර්දේශ කරන ලදී.

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ ව්‍යවස්ථාව යටතේ සභාවේ කාර්යන් සහ කාර්තව්‍යයන්

4.1. අග්‍රවිනිශ්චයකාර ධුරයට පත් කිරීම

වත්මන් අග්‍රවිනිශ්චයකාර ජනාධිපති නීතීඥ ගරු එම්. එන්. බී. ප්‍රනාන්දු මහත්මිය 2025.07.27 දින සිට විශ්‍රාම යාමට නියමිත බැවින්, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ගරු පී. පී. සුරසේන මහතා අග්‍රවිනිශ්චයකාර ධුරයට පත් කිරීමට ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් සලකා බලන ලදී.

ගරු විනිශ්චයකාර පී. පී. සුරසේන මහතා වර්තමානයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ වඩාත් ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයා බවත්, ඔහුට නොකැලැල් වෘත්තීය වාර්තාවක් සතු බවත්, සභාව නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) ව්‍යවස්ථාව යටතේ, වත්මන් අග්‍රවිනිශ්චයකාර ජනාධිපති නීතීඥ ගරු එම්. එන්. බී. ප්‍රනාන්දු මහත්මිය විශ්‍රාම යාමට නියමිත 2025.07.27 දින සිට ක්‍රියාත්මකවන පරිදි, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ගරු පී. පී. සුරසේන මහතා අග්‍රවිනිශ්චයකාර ධුරයට පත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් අනුමත කරන ලදී.

4.2. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම

4.2.1. ගරු විනිශ්චයකාර ඊ්. ඒ. ජී. ආර්. අමරසේකර මහතා 2025.06.17 දින විශ්‍රාම යාමත් සමඟ අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ ඇති වූ පුරප්පාඩුව සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ගරු එම්. ඒ. සමයවර්ධන මහතා පත් කිරීමට ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් සලකා බලන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඈ (2) ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ දක්වා ඇති පරිදි, මහෙස්ත්‍රාත්වරයෙකු හෝ දිසා විනිසුරුවරයෙකු ලෙස සේවයේ යෙදී සිටීමේ පළපුරුද්ද ඇති ශ්‍රේෂ්ඨාධිකරණයේ වඩාත් ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයා සමඟ අධිකරණ සේවා කොමිෂන් සභාව සමන්විත විය යුතුය යන අවශ්‍යතාවය සභාව විසින් සැලකිල්ලට ගන්නා ලදී. ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ගරු එම්. ඒ. සමයවර්ධන මහතා වර්තමානයේ මහෙස්ත්‍රාත්වරයෙකු හෝ දිසා විනිසුරුවරයෙකු ලෙස සේවය කර පළපුරුද්ද ඇති ශ්‍රේෂ්ඨාධිකරණයේ වඩාත් ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයා වන බව සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ සහ 111ඈ ව්‍යවස්ථාවන්හි විධිවිධාන සලකා බැලීමෙන් අනතුරුව, 2025.06.17 දින සිට

පුරප්පාඩුව පවතින අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරය සඳහා ගරු එම්. ඒ. සමයවර්ධන මහතා පත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් අනුමත කරන ලදී.

4.2.2. ගරු අග්‍රවිනිශ්චයකාර පී. පී. සුරසේන මහතා අග්‍රවිනිශ්චයකාර ධුරයට පත් කිරීමත් සමඟ අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ජනාධිපති නීතීඥ ගරු එස්. තුරයිරාජා මහතා පත් කිරීමට ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් සලකා බලන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ජනාධිපති නීතීඥ ගරු එස්. තුරයිරාජා මහතා වර්තමානයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ වඩාත් ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයා බව සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) සහ 111ඇ (1) ව්‍යවස්ථා යටතේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ජනාධිපති නීතීඥ ගරු එස්. තුරයිරාජා මහතා එකී පුරප්පාඩුවට පත් කිරීම සඳහා ගරු ජනාධිපතිවරයාගේ නිර්දේශය සභාව විසින් අනුමත කරන ලදී.

4.3. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර ධුරයට පත් කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) ව්‍යවස්ථාව යටතේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර ධුරයේ දැනට පවතින පුරප්පාඩුවක් සඳහා අභියාචනාධිකරණ විනිශ්චයකාර ගරු කේ. එම්. ජී. එච්. කුලතුංග මහතා පත් කිරීමට ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් සලකා බලන ලදී.

ඒ අනුව, අභියාචනාධිකරණ විනිශ්චයකාර ගරු කේ. එම්. ජී. එච්. කුලතුංග මහතා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර ධුරයට පත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) ව්‍යවස්ථාව යටතේ සභාව විසින් අනුමත කරන ලදී.

4.4. පොලිස්පති ධුරයට පත් කිරීම

ටී. එම්. ඩබ්ලිව්. ඩී. තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීමත් සමඟ ඇති වූ පුරප්පාඩුව සඳහා, දැනට එම ධුරයේ වැඩ බලන, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ඩබ්ලිව්. එල්. ඒ. එස්. ප්‍රියන්ත මහතා පොලිස්පති ධුරයට පත් කිරීමට ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් සලකා බලන ලදී.

ඒ අනුව, සභාවේ සලකා බැලීම සඳහා, නාමිකයා වගඋත්තරකරුවකු ලෙස සඳහන් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති මූලික අයිතිවාසිකම් අයදුම්පත් සහ මේ වනවිට අවසන් කර ඇති නඩු කටයුතු ඇතුළු අධිකරණය ඉදිරියේ ගොනු කර ඇති වෙනත් නඩු සම්බන්ධයෙන් ගරු නීතිපතිතුමාගෙන් වාර්තාවක් ලබා ගැනීමට සභාව විසින් තීරණය කරන ලදී. නාමිකයා සම්බන්ධයෙන් පසුගිය අවස්ථාවල පනවන ලද දණ්ඩන, විභාග වෙමින් පවතින විමර්ශන ඇතුළු විනය ක්‍රියාමාර්ග සහ ඕනෑම පැමිණිලි සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සහ ජාතික පොලිස් කොමිෂන් සභාව වෙතින් වාර්තා ලබා ගැනීමට ද සභාව විසින් තීරණය කරන ලදී.

නාමිකයාගේ සුදුසුකම් සහ පළපුරුද්ද සමඟ ගරු නීතිපතිතුමා වෙතින්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සහ ජාතික පොලිස් කොමිෂන් සභාව වෙතින් ලබා ගන්නා ලද වාර්තා සභාව සලකා බැලීමෙන් අනතුරුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) ව්‍යවස්ථාවේ විධි විධාන වලට අනුව ඩබ්ලිව්. එල්. ඒ. එස්. ප්‍රියන්ත මහතා පොලිස්පති ධුරයට පත් කිරීමට ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් අනුමත කරන ලදී.

4.5. විගණකාධිපති ධුරයට පත් කිරීම

විගණකාධිපති ධුරයේ පුරප්පාඩුව සඳහා ඕ. ආර්. රාජසිංහ මහතා පත් කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 සහ 41ඇ (1) ව්‍යවස්ථා යටතේ, ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සහාව විසින් සලකා බලන ලදී. ඒ අනුව, ඕ. ආර්. රාජසිංහ මහතා විගණකාධිපති ධුරයට පත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් අනුමත නොකරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (2) ව්‍යවස්ථාව යටතේ, විගණකාධිපති ධුරයට ස්ථිර පත්කිරීමක් සිදු කරන තෙක් 2025.11.23 දින සිට මාස තුනක (03) කාලයක් සඳහා විගණකාධිපති ධුරයේ වැඩ බැලීම සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති ජී. එච්. ඩී. ධර්මපාල මහතා පත් කිරීමට ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් සලකා බලන ලදී. ඒ අනුව, මෙම කාරණය සලකා බැලීමෙන් සහ දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව, සභාවේ සාමාජිකයින් පස් දෙනෙකුට නොඅඩු පිරිසකගේ සහාය ඇතිව, ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් අනුමත නොකරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (2) ව්‍යවස්ථාව යටතේ, 2025.12.07 දින සිට ආරම්භ වන මාස තුනක (03) කාලයක් සඳහා විගණකාධිපති ධුරයේ වැඩ බැලීම සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති එල්.එස්.අයි. ජයරත්න මහත්මිය පත් කිරීමට ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් සලකා බලන ලදී. කෙසේ වෙතත්, 2025.12.07 වන දින සිට ආරම්භ වන මාස තුනක (03) කාලයක් සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති එල්.එස්.අයි. ජයරත්න මහත්මිය විගණකාධිපති ධුරයේ වැඩ බැලීම සඳහා පත් කිරීමට ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සම්බන්ධයෙන් මෙම රැස්වීමට සහභාගී වූ සභාවේ සාමාජිකයින් පස් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකගේ සහාය ඇතිව තීරණයක් ගැනීමට සභාවට නොහැකි විය.

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැර වෙනත් ලිඛිත නීති මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පනවා ඇති හෝ පවරා ඇති කාර්යන් සහ කර්තව්‍යයන් ඉටු කිරීම

5.1 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ ඇති වූ පුරප්පාඩුව සඳහා අයදුම් කරන ලද අයදුම්කරුවන් සභාව විසින් කෙටි ලැයිස්තුගත කරන ලද අතර එම කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවන ලදී.

අපේක්ෂකයින්ගේ සුදුසුකම් සහ යෝග්‍යතාවය සලකා බැලීමෙන් අනතුරුව, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 12 වගන්තිය ප්‍රකාරව, විශ්‍රාමික විනිශ්චයකාර උපාලි අබේරත්න මහතා ඉල්ලා අස්වීමත් සමඟ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ ඇතිවූ පුරප්පාඩුව සඳහා දයාරත්න ලංකාපුර මහතා පත් කිරීමට සභාව විසින් නිර්දේශ කරන ලදී.

5.2 ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ (PUCSL) සාමාජික ධුරයට පත් කිරීම

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සාමාජික ධුරය සඳහා නිර්දේශිත නාමිකයා සමඟ 2025.07.09 වන දින සභාව විසින් සාකච්ඡාවක් පවත්වන ලදී.

සලකා බැලීමෙන් අනතුරුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඉ ව්‍යවස්ථාව යටතේ තීරණයක් ගැනීමට සභාව විසින් තීරණය කරන ලදී. කෙසේ වෙතත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඉ (4) වගන්තිය යටතේ දක්වා ඇති අවශ්‍යතාව පරිදි, මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම සඳහා ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ නිර්දේශය සම්බන්ධයෙන්, රැස්වීමට පැමිණ සිටි සභාවේ සාමාජිකයින් පස් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකගේ සහාය ඇතිව තීරණයක් ගැනීමට සභාවට නොහැකි විය.

5.3 කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව සඳහා සාමාජිකයින් පත් කිරීම

සවිස්තරාත්මක ඇඟයීමක් සිදු කිරීමට කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන්/ නාමිකයන් සඳහා සභාව විසින් සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. අපේක්ෂකයින්ගේ යෝග්‍යතාවය, සුදුසුකම් සහ නිපුණතා සලකා බැලීමෙන් අනතුරුව, අයදුම්පත්වලින් සහ සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත්ව තිබූ පරිදි අපේක්ෂකයින් විසින් විශේෂඥතාව පෙන්නුම් කරන අදාළ ක්ෂේත්‍රවලට නිසි සැලකිල්ලක් ලබා දෙමින්, 2025.08.07 දින පැවති රැස්වීමේදී, 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතේ 5(2) (අ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සභාව විසින් පහත අපේක්ෂකයින් නිර්දේශ කරන ලදී:

- ආචාර්ය රමණි දේවිකා ජයසුන්දර මහත්මිය;
- අබ්දුල් සරූර් සිතාරා ශ්‍රීන් මහත්මිය;
- වෛද්‍ය පද්මා ශ්‍රියානි ගුණරත්න මහත්මිය;
- වීරහැන්නෙදිගේ ජයන්ති කුරු-උතුම්පල මෙනෙවිය; සහ
- ආචාර්ය මොල්ලිගොඩ ලියනගේ කලන චමින්ද කුමාර් සේනාරත්න මහතා.

පූර්ණ කාලීන සාමාජිකයින් ලෙස සාමාජිකයින් තිදෙනෙකු පත් කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතේ 5(5) වගන්තියේ විධිවිධාන ද සභාව විසින් සඳහන් කරන ලද අතර, ඉහත අපේක්ෂකයින්ගෙන් සහ එකී පනතේ 5(2) (ආ) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය විසින් නාම යෝජනා කරනු ලැබූ නීතිඥ ජනහා සෙල්වරාස් මෙනෙවිය සහ ගම්පහ දිස්ත්‍රික් ''අයිතිවාසිකම් වෙනුවෙන් කාන්තාවන්'' සංගමයේ විධායක සභික සහ බියගම වෙළඳ කලාපයේ සේවකයින් සඳහා වන ජාතික මධ්‍යස්ථානයේ සංවිධායක ධම්මිකා සෝමරත්න මහත්මියගෙන් පූර්ණ කාලීන සාමාජිකයින් වශයෙන් පත් කරනු ලැබීමට ඇති කැමැත්ත විමසන ලදී. ඒ අනුව, ආචාර්ය රමණි දේවිකා ජයසුන්දර මහත්මිය, අබ්දුල් සරූර් සිතාරා ශ්‍රීන් මහත්මිය සහ නීතිඥ ජනහා සෙල්වරාස් මෙනෙවිය කොමිෂන් සභාවේ පූර්ණ කාලීන සාමාජිකයින් ලෙස පත් කරනු ලැබීමට සිය කැමැත්ත පළ කරන ලදී.

ඉහත අපේක්ෂකයින්ගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ නාමිකයින් දෙදෙනාගේ යෝග්‍යතාවය, සුදුසුකම් සහ නිපුණතා සහ කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතේ 5 (5) වගන්තියේ විධිවිධාන යටතේ නියම කර ඇති අවශ්‍යතා සලකා බැලූ සභාව, එකී පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සභාපති ලෙස ආචාර්ය රමණි දේවිකා ජයසුන්දර මහත්මිය පත් කිරීමට සභාව විසින් නිර්දේශ කරන ලදී.

5.4 හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජික ධුරයට පත් කිරීම

2025 ජුනි 12 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජික ධුරයේ ඇති වී තිබූ පුරප්පාඩුවක් පිරවීම සඳහා සභාව විසින් අයදුම්පත් කැඳවන ලද අතර, 2025 ජූලි 06 සහ 2025 අගෝස්තු 25 යන දිනවල තවත් පුරප්පාඩු තුනක් (03) ඇති වීමට නියමිතව තිබුණි. ඒ අනුව,

පුරප්පාඩුව සඳහා අයදුම් කරන ලද අයදුම්කරුවන් අතරින් අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කර සභාව විසින් ඔවුන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවන ලදී.

හානිපූරණය සඳහා වන කාර්යාලය පනතේ 4 (4) වගන්තිය ප්‍රකාරව සපුරාලිය යුතු අවශ්‍යතා සමඟ සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය සලකා බැලීමෙන් අනතුරුව, එකී පනතේ 4(1) වගන්තිය ප්‍රකාරව හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජික ධුරයට පත් කිරීම සඳහා පහත සඳහන් අයදුම්කරුවන් ගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ කිරීමට සභාව විසින් තීරණය කරන ලදී:

- වසන්තා පෙරේරා මහත්මිය;
- ජෝසප් ටෙරන්ස් ඥානානන්දන් සුන්දරම් මහතා;
- සංජීව විමලගුණරත්න මහතා; සහ
- මොහොමඩ් අන්සාර් මරිකාර් උම්මුල් කයිර් නදීහා මහත්මිය.

තවද, එකී පනතේ 4(2) වගන්තිය ප්‍රකාරව, හානිපූරණය සඳහා වන කාර්යාලයේ සභාපති ධුරයට පත් කිරීම සඳහා සභාව විසින් පහත ලැයිස්තුගත කර ඇති අනුපිළිවෙල පරිදි පහත සඳහන් නම් තුන ද නිර්දේශ කරන ලදී:

1. වසන්තා පෙරේරා මහත්මිය;
2. ජෝසප් ටෙරන්ස් ඥානානන්දන් සුන්දරම් මහතා; සහ
3. සංජීව විමලගුණරත්න මහතා.

5.5. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ (OMP) සාමාජික ධුරයට පත් කිරීම

2025.10.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජික පරාක්‍රම ජයන්ත කුමාර් සිල්වා විජේවංශ වික්‍රමසිංහ මහතාගේ ධුර කාලය අවසන් වීමට නියමිතව තිබීම හේතුවෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ (OMP) සාමාජික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම සඳහා සභාව විසින් අයදුම්පත් කැඳවන ලදී. ඒ අනුව, සභාව විසින් පුරප්පාඩුව සඳහා අයදුම් කරන ලද අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කරන ලදී.

5.6. සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයට (WBB) සාමාජිකයින් පත් කිරීම

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සාමාජික ධුරය සඳහා නිමල් කොටවෙලගෙදර මහතා, අයන්ති ද සිල්වා මහත්මිය, ආචාර්ය ටී. එම්. එස්. පී. කේ. තෙන්නකෝන් මහත්මිය සහ සමීර උදයන්ත අල්විස් මහතා යන මහත්ම මහත්මීන් පත් කිරීමට සහ නූර් රිස්නා අනීස් මහත්මිය නැවත පත් කිරීමට ගරු මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ නිර්දේශය සඳහා සභාවේ එකඟතාවය ඉල්ලා සිටිමින්, ගරු අමාත්‍යතුමාගෙන් ලද සන්නිවේදනය සභාව විසින් සලකා බලන ලදී.

සාකච්ඡා කිරීමෙන් අනතුරුව, ඉහත නාමිකයන් සභාව සමඟ සාකච්ඡාවක් සඳහා කැඳවීමට සභාව විසින් තීරණය කරන ලදී.

ඒ අනුව, නාමිකයන්ගේ යෝග්‍යතාවය සහ ගරු මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද තෝරාගැනීමේදී අනුගමනය කළ යුතු උපමාන නිසි ලෙස සැලකිල්ලට දැක්වීමෙන් අනතුරුව 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 4(2) වගන්තිය ප්‍රකාරව නිමල් කොටවලගෙදර මහතා සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපති ලෙස පත් කිරීමටත්, අයන්ති ද සිල්වා මහත්මිය සහ ආචාර්ය ටී.එම්.එස්.පී.කේ තෙන්නකෝන් මහත්මිය සාමාජිකයින් ලෙස

පත් කිරීමටත්, නූර් රිස්නා අනීස් මහත්මිය සාමාජිකාවක් ලෙස නැවත පත් කිරීමටත් සඳහා වූ නාමයෝජනා සමඟ සභාව එකඟ විය. කෙසේ වෙතත්, සමීර උදයන්ත අල්විස් මහතා සම්බන්ධයෙන් වන ළබැඳියාවන් අතර ගැටුමක් හේතුවෙන් ඔහු පත් කිරීම සඳහා වූ නාමයෝජනාව සමඟ එකඟ නොවීමට සභාව විසින් තීරණය කරන ලදී.

5.7. ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයේ සාමාජික ධුරයට පත් කිරීම

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 8(2) (ආ) සහ 15(3) වගන්ති ප්‍රකාරව, රජීව් අමරසූරිය මහතාගේ ඉල්ලා අස්වීමත් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයේ සාමාජික ධුරයේ ඇතිවූ පුරප්පාඩුව සඳහා ජනාධිපති නීතිඥ මෛත්‍රී එවන් වික්‍රමසිංහ මහතා පත් කිරීමට ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය, ජනාධිපති නීතිඥ වික්‍රමසිංහ මහතාගේ ජීව දත්ත පත්‍රිකාව ද සමඟ සභාව විසින් සලකා බලන ලදී.

ඒ අනුව, මීට සමාන පත්වීම් සඳහා අනුමතිය ලබා දීමේදී අනුගමනය කරන ලද සභාවේ අතීත පූර්වාදර්ශය සඳහන් කරමින්, එකී පනතේ 17 වගන්තියේ දක්වා ඇති අවශ්‍යතා සනාථ කර ගැනීම සඳහා සභාව විසින් දිවුරුම් ප්‍රකාශයක් ලබා ගන්නා ලදී.

නාමිකයාගේ යෝග්‍යතාවය සහ නාමිකයා විසින් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශය සලකා බැලීමෙන් අනතුරුව, එකී පනතේ 15(4) වගන්තිය ප්‍රකාරව, එකී පුරප්පාඩුව සඳහා ජනාධිපති නීතිඥ මෛත්‍රී එවන් වික්‍රමසිංහ මහතා පත් කිරීමට ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් අනුමත කරන ලදී.

6. සභාවේ කාර්යයන් සහ කර්තව්‍යයන් කිරීම සහ ඉටු කිරීම සම්බන්ධ නීති සම්පාදනය කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඌ (3) ව්‍යවස්ථාව මගින් නියම කර ඇති පරිදි, සභාව එහි කාර්යය සහ කර්තව්‍යයන් කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් කෙටුම්පත් කරන ලද රීති නැවත සලකා බැලීමේ ක්‍රියාවලියේ නිරතව සිටී. ඒ අනුව, සභාව විසින් කෙටුම්පත් කරන ලද රීති සම්බන්ධයෙන් ගරු නීතිපතිතුමාගේ නිරීක්ෂණ ලබා ගන්නා ලදී. අන්‍යෝන්‍ය ගරුත්වයේ මූලධර්මයට අනුව සංශෝධිත රීති ගරු ජනාධිපතිතුමාගේ සලකා බැලීම සඳහා යොමු කිරීමට ද සභාව විසින් තීරණය කරන ලදී.

7. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම

සමාලෝචිත කාල සීමාව තුළ, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ඉල්ලීම් පහත පරිදි ලැබී ඇති අතර, පහත දක්වා ඇති පරිදි ප්‍රතිචාර යවා ඇත:

ලැබී ඇති ඉල්ලීම් සංඛ්‍යාව	5
සම්පූර්ණයෙන්/අර්ධ වශයෙන් තොරතුරු සපයා ඇති ඉල්ලීම් සංඛ්‍යාව	0
ප්‍රතික්ෂේප කරන ලද හෝ නිෂ්ප්‍රභා කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව	5
අභියාචනා සංඛ්‍යාව	1
ප්‍රතිචාර ලබා දී ඇති අභියාචනා සංඛ්‍යාව	0
ප්‍රතික්ෂේපිත අභියාචනා සංඛ්‍යාව	1

8. **සභාවේ සාමාජිකයින් වගඋත්තරකරුවන් ලෙස දක්වමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් අයදුම්පත්**

i. SC FR 164/2025